ධීවර අමාත්‍යාංශය

ලංකා ධීවර සංස්ථාව

# පුරප්පාඩු

ලංකා ධීවර සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සේවා ගණය : කළමනාකාර**

**තනතුර : කළමනාකාර/ජ්‍යෙෂ්ඨ කළමනාකාර (අභ්‍යන්තර විගණන) එම් එම් 1-1**

**සුදුසුකම්**

**බාහිර අපේක්ෂකයින් ( පහත 1 හෝ 2 හෝ 3 හෝ 4 )**

**1.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වාණිජ/ගණකාධිකරණය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක/පිළිගත් වාණිජ ආයතනයක පළමුවන උපාධිය ලබා ගැනීමෙන් පසු විගණන කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර එකක (01) පලපුරුද්දක් ලබා තිබීම.

**2.** ගිණුම්කරණය හෝ මූල්‍ය ක්ෂේත්‍රයට හෝ අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයකින් අන්තර් පෙළ සමත්ව තිබීම. (ICA / CIMA / ACCA )

සහ

රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක/පිළිගත් වාණිජ ආයතනයක විගණන කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර එකක (01) පලපුරුද්දක් ලබා තිබීම.

**3.** සහතික කළ ගිණුම්කරණය කිරීම පිළිබඳ සහතික පත්‍රය ලබා තිබීම. (CMA )

සහ

රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක/පිළිගත් වාණිජ ආයතනයක විගණන කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර එකක (01) පලපුරුද්දක් ලබා තිබීම.

**4**. ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම. ( HNDA )

රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක/පිළිගත් වාණිජ ආයතනයක විගණන කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර එකක (01) පලපුරුද්දක් ලබා තිබීම.

වැටුප **: MM 1-1 – 2016 රු.[53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575]**

**රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා (ජීවන වියදම් දීමනාව හා අයවැය දීමනාව) හිමි වේ.**

වෙනත් ප්‍රතිලාභ

1) සේවක අර්ථසාධක අරමුදල් වෙනුවෙන් වැටුපෙන් අඩු කර ගන්නා 10% දායක මුදල සඳහා සංස්ථාව මඟින් 15% දායක මුදලක් බැර කරනු ලැබේ.
2) සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3% ක ප්‍රදානයක් බැර කරනු ලැබේ.
3) රජයේ චක්‍රලේඛ අනුව ප්‍රවාහන පහසුකම්

පොදු කොන්දේසි

(අ) අපේක්ෂකයින්ගේ වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි අයවිය යුතු වේ.

(ආ) රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ඈ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු වේ.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත තොරතුරු (CV) හා අදාල අධ්‍යාපන සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර සමඟ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව **2023.05.04** දිනට හෝ ඊට ප්‍රථම තනතුරේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (E mail : Chairman@cfc.gov.lk )

සභාපති
ලංකා ධීවර සංස්ථාව
නො15. රොක් හවුස් පටමුග
කොළඹ 15.
දුරකථන අංකය: 0112-540455